# අධ්‍යාපන පසුබටතාව පිළිබඳ බෞද්ධ ආකල්පය

ටී ජී අයි පී සෝමරත්න[1]
අම්පේ විමලධම්ම හිමි[2]

අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වී ඇති බොහෝ කථිකාවත් අතර අධ්‍යාපන පසුබටතාව ප්‍රමුඛය සංකල්පයක් ලෙස හඳින්විය හැකිය. මෙය විද්වතුන්ගේ අවධානයට හා සාකච්ඡාවට බඳුන් වී සියවසකටත් ආසන්නය. ඒ සඳහා නොයෙකුත් විවරණ හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඉදිරිපත් ව තිබුණද ගැටලුව සඳහා ඒවායේ සප්‍රමාණ බව විවාදයට බඳුන්ව ඇත. සදාචාර දර්ශනයක් වන බුදු සමය ඇසුරින් අධ්‍යාපන පසුබටතාව පිළිබඳ ගැටලුවට විවරණයක් සපයා ගත හැකිදැයි විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වෙයි.

අධ්‍යාපන කාර්යයෙහි යෙදෙන්නන් අතරින් සියල්ලෝ සාර්ථක ඵල නෙළා නොගනිති. එයින් යම් කොටසක් අධ්‍යාපන කාර්යෙහි පසුගාමීව හා උදාසීනව අදාල ඉලක්ක කරා ලඟා වෙති. තමන්ගේ වයසට ගැලපෙන අධ්‍යාපනික පසුබිම තුළ අධ්‍යාපනය පහසුවෙන් හැදෑරිය නොහැකි පුද්ගලයා පසුබට ශිෂ්‍යයා ලෙස හඳුනා ගනී. මේ පිළිබඳ කරන ලද පර්යේෂණ වලට අනුව අධ්‍යාපනයේ ගුණාත්මක භාවය පිළිබඳ අවධානය යොමුකිරීමට නම් පසුබට ළමුන් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. පාලනය කළ හැකි හා පාලනය කළ නොහැකි ලෙස අධ්‍යාපන පසුබටතාව පිළිබඳ ගැටලුව දෙයාකාරය. එයින් පාලනය කළ හැකි අංශය වෙත නූතන අධ්‍යාපනඥයින්ගේ නිබඳ අවධානය යොමුවී ඇත. අධ්‍යාපන ක්‍රියාවලියේදී පසුබට දරුවා හඳුනා ගැනීම අනිවාර්ය වූවකි. එසේම ඒ සඳහා බලපාන කරුණු ශාරීරික , බුද්ධිමය හා වෙනත් පාරිසරික හේතු ලෙස හඳුනාගත හැකිය. සෙමෙන් ඉගනීම හෙවත් අධ්‍යාපන පසුබටතාව ඉක්මවීම සඳහා නූතන අධ්‍යාපනඥයින් ඉදිරිපත් කරන යෝජනා අතර අභිප්‍රේරණය, ප්‍රායෝගික හා සරල ඉගැන්වීම් ක්‍රම, ඉගෙනුම් ආධාරක වැනි ක්‍රමෝපායන් ප්‍රධානය.

බුදුසමය නෛසර්ගිකවම දේශනා ක්‍රියාවලියක් වන බැවින් එය ඊටම ආවේණික වූ සුවිශේෂ අධ්‍යාපන ක්‍රියාවලියකට ද උරුමකම් කියයි. බුදුන් වහන්සේ තමන් වහන්සේ සාක්ෂාත් කරගත් අධ්‍යාත්මික අධිගමය වෙත අනුගාමිකයන් යොමු කරවීමේදී කාර්යක්ෂම හා ඵලදායී අධ්‍යාපන ක්‍රමවේදයන් භාවිත කොට ඇති අතර එම ක්‍රමවේදයන් නූතන ක්‍රමවේදයන් හා සැසඳීමේදී අනන්‍ය හා සුවිශේෂ වූවක් වන බව පැහැදිලිය. ස්වකීය ධර්ම අධ්‍යාපන ක්‍රියාවලියේදී උන්වහන්සේ සියලු දෙනා වෙත ඉදිරිපත් කළේ එකම ක්‍රමවේදයක් නොවේ. පුද්ගල විවිධත්වය පිළිබද අතිශයින් සැලකිලිමත් වූ උන්වහන්සේ අවබෝධ ක්‍රියාවලියේ දී දැක්වූ අසමර්ථතාව හේතුවෙන් සමාජයෙන් නෙරපාදැමුණු පුද්ගලයින්ට පවා ඵලදායි ක්‍රමෝපායන් මගින් ස්වකීය අභිමතාර්ථ සාධනය කරවීමට මඟපෙන්වූහ. බුද්ධ දේශනය තුළ උද්ග්‍රහණයේ වෛමත්තතාව විස්තර වන ආකාරයත් එයින් පසුබට පුද්ගලයින් විෂයෙහි භාවිත බෞද්ධ නිර්දේශ මතුකර ගැනීමෙන් අධ්‍යාපන පසුබටතාව හෙවත් සෙමෙන් ඉගනුම පිළිබඳ ගැටලුවට විසඳුම් සපයා ගත හැකිය.

**ප්‍රමුඛ පද :** අධ්‍යාපන පසුබටතාව, බුදුදහම, සඵල ඉගෙනුම

---

1 ආරාධිත කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2 සහය කථිකාචාර්ය, අනුරාධපුර භික්ෂු විශ්වවිද්‍යාලය
indikasomaratne@gmail.com